# 1

# අකීදා

ثُمَّ أَرْسَلْنَا رُسُلَنَا تَتْرَا كُلَّ مَا جَاءَ أُمَّةً رَّسُوْلُهَا كَذَّبُوْهُ فَأَتْبَعْنَا بَعْضَهُمْ بَعْضًا وَّجَعَلْنٰهُمْ أَحَادِيْثَ فَبُعْدًا لِّقَوْمٍ لَّا يُؤْمِنُوْنَ

**"ඉන් පසු අපගේ රසූල්වරු අනුපිළිවෙළින් අපි පහළ කළෙමු. ජනතාව වෙත ඔවුන්ගේ රසූල්වරයෙකු පැමිණි සෑම අවස්ථාවක ම ඔවුහු ඔහු බොරුකාරයකු ලෙස සැලකූහ. එවිට ඔවුන්ගෙන් පිරිසකට පසු තවත් පිරිසකට පිළිවෙලින් දඬුවම් විඳින්නට සැලැස්වීමු. තව ද අපි ඔවුන් (හුදු ජනප්‍රවාද) කතාවක් බවට පත් කළෙමු. විශ්වාස නොකරන ජනයාහට අල්ලාහ්ගේ රහ්මතය ඉතා දුරස් ව ඇත. " (23:44)**

අකීද යන පදය, කිසි ම සැකයකින් තොර ව ස්ථිර ව විශ්වාස කර පිළිගැනීම යන අදහස දක්වයි. ඉස්ලාමීය ව්‍යවහාරයේ දී අකීද යනු "අර්කානුල් ඊමාන්" යන මූලික ඉස්ලාමීය විශ්වාස හා ඒ හා සම්බන්ධ විෂය වේ. මෙහි බහු වචන නාම පදය ලෙස "අල් අකාඉද් " භාවිත වේ.

ලෝකයේ බිහි වුණු සියලු ම නබිවරු හා රසූල්වරු එක ම අකීදවක් දේශනා කළහ. මෙම සත්‍ය අල් කුර්ආනය පහත සඳහන් අන්දමට පෙන්වා දෙයි. " අප නූහ්ට ධර්මයෙන් අනුශාසනා කළ දේ, තව ද නුඹ වෙත පහළ කළ දේ, තව ද ඊසා, මූසා, ඉබ්රාහීම් යනාදි අයට අප අනුශාසනා කළ දේ ඔහු නුඹලා වෙත ද නියම කොට තිබේ. නුඹලා ඒ දීන් (ඉස්ලාමීය ජීවන මාර්ගය) තහවුරු කරනු. එතුළ නුඹලා බෙද බින්න නොවනු යන්න ය."(42:13)

මිනිස් ඉතිහාසයේ සියලු ම කාලවල දී දේව දූතයන් විසින් දේශනය කළ අකීදව එකකි. නමුත් කාලයාගේ ඇවෑමෙන් අවස්ථාවට සරිලන පරිදි ෂරීආ (නීති සංග්‍රහය) වෙනස් වී ඇත. නමුත් නබිවරුන්ට පසු ආ ජනයා දේවදූතයන් විසින් දේශනය කළ අකීදවට හානි සිදු කර ඇත. මෙවන් අවස්ථාවල අල්ලාහ් විසින් නබිවරුන් හා රසූල්වරුන් යවා නිවැරදි අකීදව දේශනය කරන ලදි.

මේ අතුරින් මුහම්මද් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා අල්ලාහ්ගේ මග පෙන්වීම අනුව අකීදව දේශනය කළේ ය. එතුමා විසින් දේශනය කළ අකීදව අල් කුර්ආනය හා සුන්නාවෙහි අන්තර්ගත වී ඇත.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ කාලයේ හා සහාබාවරුන්ගේ කාලයේ ද ඉස්ලාමීය අකීදව නිවැරදි ව පැවතුණි. ඔවුහු මේ ගැන කිසි ම ප්‍රශ්නයක් හෝ සැකයක් ඇති නොකළහ. දේව දූතයන් විසින් දේශනා කළ අකීදව එය දේශනා කළ පරිදි ම විශ්වාස කර පිළිපැදී අතර ඒ සඳහා තම බුද්ධිය පදනම් කර ගෙන අර්ථකථන ලබා දුන්නේ නැත.

නමුත් ඉස්ලාමීය ඉතිහාසයේ පසු කාලයේ දී මුස්ලිම් සමාජය තුළ ඇති වුණු දේශපාලන ගැටුම්, ඉස්ලාම් නොවන අයගේ අදහස්, ආගම් අතර ඇති වුණු සම්බන්ධතා, සහයෝගිතා, බුද්ධිය සීමා ඉක්මවා භාවිත කිරීමේ තත්ත්වය, අන්තවාදී වීම, ස්ව කැමැත්ත අනුව ක්‍රියා කිරීම, සතුරන්ගේ කුමන්ත්‍රණ හා මිත්‍යා විශ්වාස යන හේතූන් නිසා අකීදවේ (සරල) චාම් ගතිය නැති විය. එහි ජවය හා උසස්බව හීන විය. අකීද සම්බන්ධ කරුණු හුදෙක් ම දර්ශනික ගැටුම්වලට හා වාද විවාදවලට ගොදුරු වී වෙනස් විය.

හිත පිරිසිදු කර, චර්යාව නිවැරදි කර, තනි පුද්ගලයා හා සමාජය උසස් තත්ත්වයට ගෙන යා යුතු අකීදව, දර්ශනික විමසීම්වලට ලක්වීම හා හුදෙක් පර්යේෂණ සඳහා බඳුන් වන්නක් ලෙසට පත්වීමේ භයානක තත්ත්වයක් උදා වී ඇත. මෙම හේතුව නිසා කාලයාගේ ඇවෑමෙන් අකීදව කේන්ද්‍ර කොට ගෙන විවිධ දාර්ශනික කොටස් බිහි විය. මෙයට කවාරිජ්, කදරියියා, ජබරියියා, මුඃතසිලා, මුර්ජියියා යනාදිය නිදසුන් ලෙස දැක්විය හැක. ඔවුහු පාරිශුද්ධ ඉස්ලාමීය අකීදවට විරුද්ධ, නොමග යවන ප්‍රතිපත්ති හා අදහස් ඉදිරිපත් කළහ.

අලි රළියල්ලාහු අන්හු තුමාගේ කාල පරිච්ඡේදයේ දී මුස්ලිම් සමාජය තුළ අකීදව පිළිබඳ වූ පළමු කොටස බිහි විය. මහා පාපි ක්‍රියා කළවුන්ගේ තත්ත්වය කුමක් ද යන්න ගැන ඇති වුණු අදහස් ගැටුම් නිසා මුඃතසිලාවරුන් බිහි වීමට හේතු විය. මොවුන්ගේ අදහස් අනුව මහා පාප කර්මයක් සිදු කළවුන් "කාෆිර්" වේ. මේ ආකාරයෙන් තමන් සමග සම්බන්ධ නොවන සියලු ම මුස්ලිම්වරුන්ට, මොවුහු " කාෆිර්වරු " යැයි පැවසූහ.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාට පසුව කිලාෆතයට සුදුස්සා තෝරා ගැනීමේ දී ඇති වුණු දේශපාලන ගැටලු පදනම් කරගෙන බිහි වුණු " ෂීආවරුන් " යන කොටස පසු කාලයේ දී අකීදවට පටහැනි කණ්ඩායමක් ලෙස දියුණු විය.

අකීදවට පටහැනි දර්ශනය බිහි වන විට එහි බලපෑම්වලින් අකීදවෙහි පාරිශුද්ධතාව රැකීමට ඉමාම්වරු දැඩි ලෙස වෙහෙස වූහ. ඔවුන් අතර ඉමාම් අහමද් ඉබ්නු හන්බල්, ඉමාම් අබුල් හසන් අල් අෂ්අරි, අබූ මන්සූර් අල්මාන් තුරුදී, අබූ ජඃෆර් අත්තහාවි යනාදීන් සඳහන් කළ යුතු අය වේ.

මුඃතසීලා චින්තනයට විරුද්ධ ව සටන් කළ ඉමාම් අහ්මද් තුමා "මම ජීවත් ව සිටිය දී ඉස්ලාමය විනාශ වී යනවාට වඩා ඉස්ලාමය ජීවත් ව සිටිය දී මම මිය යෑම උතුම් ය."

යන ප්‍රකාශය, අකීදවෙහි පාරිශුද්ධතාව ආරක්ෂා කිරීමට එතුමා ගත් පරිත්‍යාගයට සාක්කි දරයි.

පරිශුද්ධ අකීදවට පටහැනිව ඇති වන චින්තනයක් එළිදක්වන විට එයින් මුස්ලිම් උම්මතය ආරක්ෂා කර ඉස්ලාමීය අකීදවෙහි සෙවණැල්ල තුළ මග පෙන්වන්නන් බිහි වෙන බව ඉතිහාසය සහතික කර ඇත.

## පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

المُعْتَزِلَةُ ◈ المُرْجِيَّةُ ◈ الجَبَرِيَّةُ ◈ القَدَرِيَّةُ ◈ الخَوَارِجُ ◈ الشِّيْعَةُ

## අභ්‍යාසය

1. අකීද යනු කුමක් ද ?
2. අකීදව ආශ්‍රිත ව නොමග ගිය දර්ශනික කොටස් හතරක් සඳහන් කරන්න.
3. අකීදවෙහි විවිධ දර්ශනික කොටස් බිහිවීමට හේතු පහක් සඳහන් කරන්න.
4. අකීදවෙහි පාරිශද්ධතාව ආරක්ෂා කිරීමට සහයෝගය ලබාදුන් ඉමාම්වරුන් සිව්දෙනෙකු සඳහන් කරන්න.